C
491.482
GUN

# වැලිවිට සරණංකර හිමිපාණන්ගේ කෘති පිළිබඳ වාග්විද්‍යානුකූල රීතිමය අධ්‍යයනය. (සාරාර්ථ සංග්‍රහය හා සතර බණවර සන්නය ඇසුරින්)

පර්යේෂණ අධීක්ෂණය

මහාචාර්ය පී.බී. මීගස්කුඹුර
සිංහල අධ්‍යයනාංශය
පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

එස්.කේ.එම්.ඩී.ඩී.ගුණතිලක

ලියාපදිංචි අංකය : GS/Mphil/94/707
විභාග අංකය : Mphil/95-96/616

**2001**

555835

# සාරාංශය

වැලිවිට සරණංකර හිමිපාණන්ගේ කෘති පිළිබඳ වාග්විද්‍යාත්මක රීතිමය අධ්‍යයනය. (සාරාර්ථ සංග්‍රහය හා සතර බණවර සන්නය ඇසුරින්)

දසවන සියවසේ සිට දේශපාලනික සමාජයීය පරිහාණියෙන් යටපත් වූ චිරන්තන සම්භාව්‍ය සාහිත්‍ය සම්ප්‍රදාය 18 වන සියවසේදී යළි ඉස්මතුවන්නේ වැලිවිට සරණංකර හිමිපාණන්ගේ ශාසනිකල ශාස්ත්‍රීය ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙසය. සරණංකර හිමි ශාස්ත්‍රීය ප්‍රතිසංස්කරණය සඳහා ග්‍රන්ථකරණයේ දී පදනම් කරගත්තේ පැරණි සිංහල අර්ථකථන සාහිත්‍යයයි. එම කෘතිවල රීතිය හැදෑරීම, අර්ථකථනයේ අධ්‍යාපන කාර්යභාරය වටහා ගැනීමට උපකාරී වේ.

කෘතියේ පළමුවන පරිච්ඡේදයෙන් පැරණි සිංහල අර්ථකථන සාහිත්‍යයේ ප්‍රභවය පිළිබඳ කරුණු ගවේෂණය කෙරෙයි. එහිදී භාරතීය අර්ථකථන ක්‍රමවේදයේ හා රීතියේ විකාශනය, අර්ථය පිළිබඳ අපරදිග මතවාද හා තුලනය කරමින් විස්තර කෙරෙයි. පාළි සාහිත්‍යයේ හා ත්‍රිපිටකයේ අර්ථකථන රීතිය මෙහිදී අදාළ කරගැනෙයි.

දෙවන පරිච්ඡේදය සිංහල අර්ථකථන වර්ගීකරණය කර අනුරාධපුර යුගයේ සිට කෝට්ටේ යුගය තෙක් භාවිත සිංහල අර්ථකථන රීති පිළිබඳ සමාලෝචනයක් කිරීමයි භාෂා රීති පිළිබඳ කෙටියෙන් දැක්වෙයි.

තෙවන පරිච්ඡේදයෙහි සීතාවක යුගයේ සිට මහනුවර යුගය තෙක් දේශපාලනික සමාජ හා සංස්කෘතික පසුබිම වෙනස්වීම කරණකොට සිංහල ගද්‍යසාහිත්‍යයේ වූ රීති විපර්යාස ද සාකච්ඡා කෙරේ. මෙම සමාජ ප්‍රතිසංස්කරණය

සඳහා වැලිවිට සරණංකර හිමියන්ගේ ශාසනික හා ශාස්ත්‍රීය සංවර්ධන ක්‍රියාමාර්ග ඇගයුමට ලක්කරනු ලැබේ. සරණංකර හිමි විසින් රචනා කරන ලද කෘති හඳුන්වා එහි රීති විමසා බැලෙයි.

සිව්වන පරිච්ඡේදය, සරණංකර හිමි රචනා කළ සාරාර්ථ සංග්‍රහයේ. ආකෘතික, අර්ථකථන හා භාෂා රීති අධ්‍යයනයයි.

පස්වන පරිච්ඡේදය සරණංකර හිමි රචනා කළ සතරබණවර සන්නයේ ආකෘතික අර්ථකථන හා භාෂා රීති අධ්‍යයනයයි.

පරිච්ඡේදාවසානයෙහි කෘතියේ අන්තර්ගත කරුණු පිළිබඳ. සමාලෝචනයක් දැක්වෙයි.

# Abstract


A Linguistico-stylistic study on the works of ven. Sri Sanranankara thero (Related to Sarartha sangrahaya and Satarabanawara sanna)

There had been a down fall of the classical literary tradition since 16th century due to the political and social degeneration of that time. As a result of the social reformation of ven. Saranakara thero, he was able to bring the past lost grandeur of the Classical Literary tradition into surface. He did all his literary reformation work, based on Exegitical Literature.

This research is mainly focused on the stylistic features used by ven. Sri Saranankara Thero in his works.

The first chapter, reveals the facts of the origin of the Traditional Exegitical Literature. The evolution of the methods and styles of the sanskrit Interpretations are comparatively described with western theories of meaning. Further the styles of Tripitaka and Attakatha is also, discussed.

The second chapter contains the evolutional process of the sinhala exegitical works. It has been classified to five groups and interpretation and language styles are mainly discussed.

Third chapter describes the stylistic evolution of prose took place in the Sitavaka and Kandyan periods based on the changes of political social and cultural background. As a resolution for this, Saranankara thero launched his work of writing to lay a better classical foundation. He wrote fifteen prose and poetic works and here eight of them are discussed on stylistic features.

Sarartha sangrahaya, compiled by Saranakara thero is taken in the forth chapter to discuss his literary and language styles.

Fifth chapter discribes structural interpretative and language styles of Satarabanavara sannaya.

At the end of the main body of the text the conclusion is added.